කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில்அமைச்சு
Ministry ofAgriculture

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය
உரஉற்பத்திமற்றும்வழங்கல்கள், இரசாயனஉரங்கள்மற்றும்கிருமிநாசினிபாவனைஒழுங்குறுத்துகைஇராஜாங்கஅமைச்சு
State Ministry of Production and Supply of Fertilizer and Regulation of Chemical Fertilizer and Insecticide Use

නො. 80/5,ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
இல.80/5,கொவிஜனமந்திரய, ரஜமல்வத்தஒழுங்கை,பத்தரமுல்லை
No. 80/5,GovijanaMandiraya, Rajamalwatta Avenue, Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය.<br>எனது இல.<br>My No. | 7/1/4/10/කා.පො.නි | ඔබේ අංකය.<br>உமது இல.<br>Your No. | | දිනය.<br>திகதி.<br>Date. | 2020.10. 22 |

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන
නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්,

මහවැලි අධ්‍යක්ෂ ජනරාල්,
වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ,

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

සභාපති, ලංකා පොහොර සමාගම,

සභාපති, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම,

**පොහොර සහනාධාර වැඩ සටහන යටතේ 2020/21 මහ කන්නයේ වී වගාව සඳහා පරිසර හිතකාමී පොහොර නිකුත් කිරීමේ චක්‍රලේඛය - ( 2/EFF/2020)**

වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව කෘෂිකර්මාන්තයේ දී මිනිසුන්ට, සතුන්ට මෙන්ම පරිසරයටද හානිදායක වන රසායනික පොහොර අධික ලෙස භාවිත කිරීම වෙනුවට සිය වගාවන් සඳහා ඉහල ගුණාත්මක භාවයෙන් යුතු පරිසර හිතකාමී පොහොර වර්ග භාවිතයට ගොවීන් හුරු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කල යුතුවේ.
මේ අනුව 2020 යල කන්නයේ සිට තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයන් කීපයක පරිසර හිතකාමී පොහොර සහනාධාර ලෙස ලබා දීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන අතර 2020/21 මහ කන්නයේදීද එම නියමු ව්‍යාපෘතිය යටතේ නොමිලේ පරිසර හිතකාමී පොහොර ලබා දෙනු ලැබේ.

1. මේ සඳහා ගුණාත්මක බවින් ඉහළ පරිසර හිතකාමී පොහොර නිෂ්පාදකයන් විවෘත ටෙන්ඩර් පටිපාටියක් මගින් තෝරා ගෙන ඇති අතර ගොවියාට ගුණත්වයෙන් ඉහළ පොහොර ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත.
2. නියමිත දිනට ගොවීන්ට පරිසර හිතකාමී පොහොර ලබාදීම හා පොහොර වර්ග වල ප්‍රමිතිය උසස් මට්ටමින් පවත්වා ගෙන යාම නිෂ්පාදකයාගේ වගකීම වේ.
3. මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අදාල වෙනත් රජයේ ආයතන තම පූර්ණ දායකත්වය ලබා දීම උදක්ම බලාපොරොත්තු වේ.